# ග්‍රන්ථ සංස්කරණය පිළිබඳ මූලික ප්‍රවේශ කිහිපයක්

(S. M. Katre විසින් 1941 දී රචිත Introduction to Indian Textual Criticism නම් කෘතියේ තෙවන පරිච්ඡේදයෙහි සිංහල අනුවාදය)

- මැදගම්පිටියේ විජිතධම්ම හිමි

අත්පිටපත්වල පෙළෙහි හෝ ලියැවිලිවල ඇතුළත් සාක්ෂ්‍ය/සාධක අර්ථ ගැන්වීම මෙන් ම හැසිරවීම ග්‍රන්ථ සංස්කරණයෙහි විෂය වෙයි. එම නිසා, හැකිතාක් දුර ආපස්සට ගොස් අනුඥාත පෙළ ප්‍රතිස්ථාපනය කිරීමට හෝ කතුවරයා විසින් ලියන ලද සිය'ත් ලිපියට හැකිතාක් ආසන්න පෙළක් නිශ්චය කිරීමට හැකි වෙයි. වෙනත් වචනවලින් කිවහොත්, ග්‍රන්ථ සංස්කරණය යනු ග්‍රන්ථයක පෙළ, එහි ප්‍රභව ආකෘතියට හැකිතාක් ආසන්න වන සේ නිශ්චය කිරීමෙහි ලා උපයුක්ත මානව ඥානයේ නිපුණ සහ ක්‍රමවේදීමය අභ්‍යාසය වෙයි. 'ප්‍රභව ආකෘතිය' යන්නෙන් අප අදහස් කරනුයේ කතුවරයා විසින් අනුඥාත ස්වරූපය යි. එවැනි ප්‍රතිස්ථාපනයක් හැමවිට ම 'ශාස්ත්‍රීය ප්‍රතිස්ථාපනය' (critical recension) යැයි හැඳින්වේ.

එක් පිළිගත් භාවිතයකට අනුව, ග්‍රන්ථ සංස්කරණය ක්‍රියාකාරකම් දෙකකට බෙදා දැක්වේ: (1) ග්‍රන්ථයක ආදි පෙළ නිශ්චය [recension] (recensio) සහ (2) සංස්කරණය [Emendation (emendatio)] යනුවෙනි. මේ සාමාන්‍ය බෙදීම යි. ආදි පෙළ නිශ්චය යන්නෙන්, සිය'ත් ලිපියට හෙවත් මූල කෘතියට ඇති සමීපත්වය පදනම් කොටගෙන වඩාත් ම විශ්වසනීය අත්පිටපත් හෝ ලේඛනමය සාධක තේරීම අදහස් කෙරේ. මෙම තෝරා ගැනීම කළ හැක්කේ විද්‍යමාන සියලු අත්පිටපත් (සාක්ෂ්‍ය) පිළිබඳ මනා ශාස්ත්‍රීය විමර්ශනයක් මාර්ගයෙන් පමණි. සංස්කරණය යනු ඉතාමත් ම හොඳ ලියවිලි හෝ සුරැකිව පවතින අත්පිටපත් වංශාවලියක වුව, සියලු අවිශ්වසනීය අංග ඉවත් කිරීම සඳහා දරන උත්සාහය යි. එක් අතකින් එය සාම්ප්‍රදායික සීමාවන් ඉක්මවා යාමක් සේ ම එම නිසා ම විචාරවත් එහෙත් ලිඛිත සාධක නොතකා හැරීම සඳහා වන ක්‍රමානුකූල උත්සාහයකි.

එෆ්. ඩබ්. හෝල් (F.W. Hall) පවසන අන්දමට, 'බොහෝ පුද්ගලයන් තුළ ග්‍රන්ථ සංස්කරණය රෝගයක් වශයෙන් සැලකීමට නැඹුරුවක් ඇත. එහෙත් එය ව්‍යාධියක් හෝ විද්‍යාවක් නොවේ. නමුත් හුදෙක් ම අත්පිටපත් ලේඛනවල ස්වීයත්වය තුළ අන්තර්ගත සාධක විමසන සියලු විමර්ශකයන්ට බාධා කරන ගැටලු රාශියක් නිරාකරණය කිරීමට සාමාන්‍ය බුද්ධිය යෙදවීම යි' (Compaion to Classical Studies, P.iii) මේ බොහෝ ගැටලු, පිළිවෙළින් පැවත ආ පිටපත් මාර්ගයෙන් ග්‍රන්ථයට පිවිසෙන දෝෂ හා සම්බන්ධ වේ. එම දෝෂ නිවැරදි කිරීමට පෙර, තමා සංස්කරණය කරන කෘතියෙහි ඉතිහාසය සලකා බැලීමට සංස්කාරකවරයා බැඳී සිටියි. එසේ නොවුනහොත්, ඔහු එවැනි පෞරාණික තත්වයක පවතින, එහෙත් නවීන ක්‍රමවලින් සාධනය කළ නොහැකි දෝෂ නිවැරදි කිරීමට උත්සාහ කරනු විය හැකිය. නොඑසේ නම්, ඔහු මුල් කතුවරයා දක්වා ගමන් කළ හැකි කෘතියක් ප්‍රශ්න කරමින් සිටිනු විය හැකිය. එම නිසා, ග්‍රීක සහ ලතින් ග්‍රන්ථ සංස්කරණය සඳහා උපයුක්ත සම්භාව්‍ය ආදර්ශය, ග්‍රන්ථ සංස්කරණ ක්‍රියාවලිය පියවර සතරකට බෙදා දක්වයි.

1. හ්‍යුරිස්තික්ස් (Heuristics) ඃ අදාළ අත්පිටපත්, සාක්ෂ්‍ය ආදි සියලු මූලාශ්‍රය අත්පිටපත් වංශාවලියක, පෙළපත් සටහනක ආකාරයෙන් රැස් කිරීම හා පටිපාටිගත කිරීම
2. රිසෙන්සියෝ (Recensio) ඃ උක්ත සාක්ෂ්‍ය පදනම් කොටගෙන හැකි තාක් පැරණි ම ස්වරූපයෙන් ග්‍රන්ථයක පෙළ නිශ්චය කිරීම.
3. එමෙන්දාතියෝ (Emendatio) ඃ කතුවරයාගේ කෘතිය යළි සැකසීම සහ
4. උත්තර විචාරය (Higher Criticism) ඃ කතුවරයා විසින් උපයුක්ත මූලාශ්‍රය වෙන්කර දැක්වීම

මෙහි පළමු ක්‍රියාදාමය, සංස්කාරකවරයාට පූර්ණ ස්වාධීන හෝ අන්තර් මිශ්‍රණය (සංකලනය) හේතුවෙන් අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ වූ අත්පිටපත්මය සාක්ෂ්‍ය (සම්ප්‍රේෂණ) සම්ප්‍රදායෙහි නිශ්චිත ශාඛා ප්‍රශාඛාවන්ට වර්ග කර දැක්වීම පහසු කරවයි. එම ක්‍රියාකාරකම ඇරඹෙන්නේ, අත්පිටපත් මගින් දැක්වෙන, කෘතියක සම්ප්‍රේෂිත ස්වරූපය අනුව සොයා ගත හැකි සාධක පරීක්ෂණයත් සමග ය. මේ

අත්පිටපත් විද්‍යමාන හෝ අවිද්‍යමාන ඒවා විය හැකිය. විද්‍යමාන අත්පිටපතක් ඇතුළත් සාධක, පිටපත් සංසන්දනයෙන් නිශ්චය කරගත යුතුය. ග්‍රන්ථයක් සංසන්දනය කිරීම යනු කිසියම් අත්පිටපතක ඇතුළත්, එම අත්පිටපතෙහි ජනක මූලාශ්‍රය හෝ මූලාශ්‍රයෙහි තත්වය නිශ්චය කර ගැනීමෙහි ලා ප්‍රයෝජනවත්, සියලු දේ නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම යි. පිටපත් සංසන්දනය සඳහා වන ප්‍රායෝගික ඉඟි කිහිපයක් සුක්තංකර් (Sukthankar) ගේ මහාභාරත ආදි පර්ව ශාස්ත්‍රීය සංස්කරණයෙහි ප්‍රස්තාවනාවේ සහ එඩ්ගර්ටන්ගේ (Edgerton) පඤ්චතන්ත්‍ර සංස්කරණයෙහි දැක්වේ. කාව්‍යමය ග්‍රන්ථ සංස්කරණයක දී එක් පද්‍යයක් ඒකකයක් වශයෙන් ගැනීම සුදුසු ය. කිසියම් හොඳ අත්පිටපතක් හෝ විශ්වාසදායක සංස්කරණයක් ප්‍රාමාණිකයක් (ආදර්ශයක්) වශයෙන් තබා ගැනීම ද සුදුසු ය. ලේඛනයේ දී, තනි කඩදාසි කොළයක උඩ සිට, මනාව වෙන්කරගත් කුඩා කොටුවල තනි අකුර බැගින් සටහන් කරගත හැකිය. එවිට මෙයින් කෙරෙන විචල්‍ය අනුක්‍රමික කොටුවෙන් පෙන්වනු ලැබේ. පිටුවේ දකුණු තීරයෙහි සංසන්දිත අත්පිටපත දැක්වෙන අතර තරමක් පුළුල් වූ වම් තීරය අතිරේක ඡේද සහ විශේෂ විමර්ශන ආදිය ඇතුළත් කිරීම සඳහා වෙන් කෙරේ. මහාභාරත ශාස්ත්‍රීය සංස්කරණය සඳහා උපයුක්ත සංසන්දන ක්‍රමවේදය පිළිබඳ පූර්ණ විස්තරයක් ඉහත දක්වන ලද සුක්තංකර්ගේ ප්‍රස්තාවනාවෙන් අධ්‍යයනය කළ හැකිය.

එඩ්ගර්ටන් විසින් අනුගමනය කරන ලද පිළිවෙත මෙසේය; ඔහු පළමුව, පූර්ව අධ්‍යයනයන් මත පදනම්ව පඤ්චතන්ත්‍රයේ මුල්පිටපත ප්‍රතිස්ථාපනය කිරීමෙහි ලා ප්‍රයෝජනවත් විය හැකි සියලු සාක්ෂ්‍ය අන්තර්ගත යැයි හෝ ප්‍රායෝගික වශයෙන් එසේ යැයි පිළිගත හැකි ඒවා තෝරා ගත්තේය. අනතුරුව, එක් එක් සංස්කරණයෙන් ආදෘත සියලු පිටපත් අනෙක් කවර හෝ විචල්‍යයක් හා කෙතෙක් සමරූපී වී දැයි සූක්ෂ්ම සංසන්දනයක් කළේය. මේ සඳහා, රීතියක් වශයෙන් එක් එක් ඒකකයට එක් ගද්‍ය වාක්‍යයක් හෝ සමහර විට වාක්‍යයක කොටසක් ඇතුළත් වන සේ හැකි කුඩා ම ඒකකවලට ඔහු විසින් ග්‍රන්ථය බෙදා ගැණින. තදනන්තරව, ඉහත දක්වන ලද ආකාරයට සමගාමීව වාක්‍යයෙන් වාක්‍යයට සංසන්දනය සිදු කෙරිණ.

එවැනි සන්සන්දනවල පදනම මත අත්පිටපත්හි පෙළපත (වංශය) පිළිබඳ සම්බන්ධය පැහැදිලි වෙයි. එහෙයින්, ඊළඟට එය පෙළපත් සටහනක මාර්ගයෙන් දැක්විය හැකිය.

දෙවන ක්‍රියාවලිය වන්නේ අර්ථ දැක්වීම යි. එහි දී අත්පිටපතේ ලිඛිත සාධක අර්ථ ගැන්වෙන අතර, ඒ සාධක මත පදනම්ව පෙළෙහි හැකිතාක් පැරණි ස්වරූපය නිශ්චය කෙරේ. ඊට අදාළ මූලධර්ම ඊළඟ පරිච්ඡේදයෙහි සාකච්ඡා කෙරෙයි. මේ අංගය ඇත්ත වශයෙන් ම ග්‍රන්ථ සංස්කරණයේ පැරණි දේ පිළිබඳ අදියරයකි. එහි අරමුණ වන්නේ, අපගේ සංස්කරණයට බඳුන් වන ග්‍රන්ථයෙහි ඉපැරණි ම නිර්ණේය/දැනගත හැකි පෙළ කවරක් දැයි සොයා ගැනීම යි.

තෙවන කාර්යය වන්නේ මූලික වශයෙන් ම කතුවරයාගේ මුල් පෙළ යළි සැකසීම යි. ඒ ලිඛිත සාක්ෂ්‍ය අනුගමනය කිරීමේ දී යම් නෛසර්ගික ප්‍රතිෂ්ඨාවන් මගින් අවශ්‍ය තැන්වල එය නොතකා හරිමිනි. අපේ සම්භාව්‍ය ග්‍රන්ථ කර්තෘවරුන් තනි තනිව නොපවතින හෙයින් මෙය කිරීම පහසු ය. හෝල් පවසන අන්දමට, සෑම සම්භාව්‍ය කතුවරයෙක් ම තනි තනිව පැවතියේ නම් හා ඔවුන් එකිනෙකාගේ කෘතියක් සම්බන්ධයෙන් ශේෂව ඇති එක ම සාධකය අත්පිටපතක් වූයේ නම්, අත්පිටපත් තුළින් අනාවරණය කරගත හැකි ග්‍රන්ථයේ ඈත ඉතිහාසයට ළඟා වීම අසීරු වනු ඇත. අත්පිටපතක් හෝ අත්පිටපත් සමූහයක්, නිශ්චිත කාලවකවානුවක කිසියම් නිශ්චිත අත් අකුරු වර්ගයකින් යුත් එක් ආදි ආකෘතියකින් පිටපත් කරනු ලැබූ බව කිව හැකිය. එසේ වුවත්, විමර්ශනය නැවැත්වීමට සිදුවන ස්ථානය පැරණිතම අත්පිටපත අයත්වන අවධියෙන් එතරම් ඈතක නොවනු ඇත. සංස්කාරකවරයා එවිට, රත්තරං නිධියක් පිළිබඳව මතුපිටින් පෙනෙන සාධක අනුව පමණක් කරුණු දක්වන පතල් ඉංජිනේරුවකුගේ තැනට පත් වෙයි. එසේ ම, ඉංජිනේරුවරයා, පෘෂ්ටයෙහි විවිධ ස්ථාන කැණීමෙන් නිධියෙහි ගමන්මග පිළිබඳ සිය සාධක එක්රැස් කර ගන්නාක් මෙන් ග්‍රන්ථ සංස්කාරවරයෙකුට විද්‍යමාන අත්පිටපත් පෙළපත ආරම්භ වීමට පෙර විවිධ අවධීන්හි ග්‍රන්ථයේ ස්වභාවය පිළිබඳ බාහිර හෙවත් වක්‍ර සාධක සොයාගත හැකිය. එවැනි වක්‍ර සාධක 'අනුසාධක' (testimonium) වශයෙන් හැඳින්වෙන අතර පුළුල් ශාස්ත්‍රීය සංස්කරණයන්හි ඒ සඳහා වෙන

ම කොටසක් ඇතුළත් කෙරේ. මේවා සාමාන්‍යයෙන් පහත සඳහන් ප්‍රවර්ගවලට බෙදා දක්වනු ලැබේ.

මධ්‍යකාලීන හෝ පුරාණ පාඨ සංග්‍රහ හෙවත් උද්ධෘත එකතු (Anthologies). මේ සඳහා නිදර්ශන කිහිපයක් වශයෙන් හාලගේ සත්තසාඉ, ශාර්ඞ්ගධරගේ පද්ධති හෝ ජල්හනගේ සූක්තිමුක්තාවලී දැක්විය හැකිය. වෙනත් කතුවරුන්ගේ ඉපැරණි කෘතිවලින් ඉදිරිපත් වන එවැනි සාධක වැඩි වැදගත්කමක් උසුලන්නේ එම කෘතීන්හි කතුවරු ග්‍රන්ථයේ විද්‍යමාන පැරණිතම අත්පිටපතටත් වඩා සියවස් කිහිපයක්වත් පූර්වතර වන බැවිනි.

එක් භාෂාවකින් තවත් භාෂාවකට පරිවර්තිත ග්‍රන්ථ ද ආදි කෘතිය හෝ ප්‍රතිලෝමික ආදි කෘතිය ප්‍රතිස්ථාපනයෙහි ලා උපකාර විය හැකිය. විශේෂයෙන් ම පරිවර්තනය, විමර්ශනයට ලක්වන කෘතියේ ඉතිරි වී ඇති පැරණිතම අත්පිටපතට වඩා පෙර යුගයක දී කරන ලද නම් එහි අගය අතිමහත් වන අතර එම සාධක ක්‍රමවත් පාඨාන්තර සංසන්දනයක අත්‍යවශ්‍ය අංශයක් නිර්මාණය කරනු ඇත. සංස්කෘත භාෂාවෙන් රචිත බොහෝ මහායාන කෘති පිළිබඳව සලකන්නේ නම් ඒවායේ මුල්කෘති ප්‍රතිස්ථාපනයට අදාළ වැදගත් ම සාධක වන්නේ ඉපැරණි යුගයක දී සිදු කරන ලද ටිබෙට් හා චීන පරිවර්තන යි. මහාභාරතයේ මුල් පෙළ ජාවානියානු (ක්‍රි. ව. 1000) සහ තෙලුගු (ක්‍රි. ව. 1025) භාෂාවන්ට පෙරළා කළ අනුවර්තන හෝ සංක්ෂේපණ අප සතු ය. මේවා පිළිවෙළින් 11 වන සියවසට අයත් වන අතර මහාභාරතයෙහි විද්‍යමාන පැරණිතම අත්පිටපත්වලට වඩා සියවස් කිහිපයක් පැරණිතර ය.

මූල කෘතිවලට අයත් බොහෝ ඡේදවල ඍජු උද්ධෘත විශේෂයෙන් ම තාක්ෂණික ස්වභාවයෙන් යුත් පසුකාලීන සාහිත්‍යවල තැනින් තැන හමු වෙයි. මෙසේ ව්‍යාකරණ හා අලංකාර ශාස්ත්‍රය පිළිබඳ කෘතිවල සාකච්ඡාවට බඳුන් කෙරෙන අදාළ රීතියෙහි හෝ නිර්වචනය කෙරෙන ප්‍රවර්ගයෙහි උදාහරණයන්හි ලා පැරණිතර කෘතීන්ගෙන් උද්ධෘත පාඨ ගණනාවක් හමු වෙයි. මේවා කර්තෘ නාම සහිතව හෝ රහිතව උද්ධරණය කොට තිබෙනු විය හැකිය.

ඍජු අනුකරණ/අනුකෘති (imitations) (කතුවරයාගේ ම අනුකරණ

ද ඇතුළත් ව), අනුකාරකයාගේ හෝ අනුකෘතියෙහි වචන (අන්තර්ගතය) ප්‍රතිස්ථාපනය සඳහා යොදා ගත හැකිය. නිදර්ශනයක් වශයෙන් කාලිදාසගේ ප්‍රකට කෘතියක් වන මේඝදූතය ගනිමු. එය ජිනසේනගේ පාර්ශ්වාභ්‍යුදය නම් තවත් කාව්‍යයකට ආශ්‍රේය වී ඇත. දෙවැන්නේ දී සෑම ශ්ලෝකයකට ම පාහේ මේඝදූතයේ අදාළ පද්‍යයේ පේළියක් හෝ දෙකක් ණයට ගෙන ඇත.

සංක්ෂේපණ සහ අනුවාද (epitomes and adaptations) (පරිකථන ද ඇතුළත්ව) ද ඒවාට පාදක වූ මූලාශ්‍රය කෘතියේ අන්තර්ගතය ප්‍රතිස්ථාපනය සඳහා අර්ධ වශයෙන් උපකාරී වෙයි. මේ අනුව කාශ්මීර් කවියකු වූ ක්ෂේමේන්ද්‍රගේ භාරතමඤ්ජරිය මහාභාරත කාශ්මීර් සංස්කරණයේ සංක්ෂේපණයක් වන අතර එය තත් සංස්කරණය පිළිබඳ කිසියම් වැටහීමක් ඇති කරයි.

අතිරේක වශයෙන් ප්‍රයෝජනවත් වන අනෙක් මූලාශ්‍රයක් වන්නේ පැරණි ව්‍යාඛ්‍යාන (commentaries) යි. අර්ථකථනයට ලක් කෙරෙන පාඨය පූර්ණ වශයෙන් හෝ උපුටනයක ස්වරූපයෙන් උද්ධරණය කරනු ලබන්නේ නම් ග්‍රන්ථයේ අදාළ කොටස ප්‍රතිස්ථාපනයේ දී එවැනි උපුටනයන් ප්‍රයෝජනවත් වෙයි.

මහාභාරතයේ හා විවිධ පුරාණවල දක්වා ඇත්තා සේ කර්තෘත්වය එක් කතුවරයෙක් කරා නොයන නමුත් කිසියම් සාම්ප්‍රදායික සාහිත්‍ය ගුරුකුලයක් වෙත හිමිවන කෘති සම්බන්ධයෙන් කුඩා කථාංග හෝ පරිච්ඡේද සම්බන්ධ සමගාමී සංස්කරණ අනෙකුත් ග්‍රන්ථවලින් හමුවීම ද වැදගත් ය. මෙලෙස ශාකුන්තල කථාංගයේ (මහාභාරත I, 62 ff.) සමගාමී සංස්කරණයක් පද්ම පුරාණයේ ඇත.

ග්‍රන්ථ සංස්කරණයේ අවසාන අදියර වන්නේ මුල් කතුවරයා විසින් උපයුක්ත මූලාශ්‍රය වෙන් කර දැක්වීම යි. ලූඩර්ස් (Die Sage von Ṛṣyaśṛṅga) වැනි විචක්ෂණ විද්වතුන් විසින් මෙවැනි මූලික අධ්‍යයන කිහිපයක් සිදු කරන ලද්දේ නමුදු ඉන්දීය ග්‍රන්ථ සංස්කරණ ඉතිහාසයෙහි ලා මෙවැනි ව්‍යායාමයකට කල් වැඩි ය. ඊට හේතුව, විශේෂයෙන් ම ප්‍රකට සම්භාව්‍ය ග්‍රන්ථ පිළිබඳ විද්‍යාත්මකව කරන ලද සංස්කරණ නොමැති වීම යි. එසේ හෙයින් වර්තමාන සංස්කරණ කටයුතු සඳහා ග්‍රන්ථ පිළිබඳ ශාස්ත්‍රීය ඇගයීමෙහි මේ සිව්වෙනි අදියර අන්තර්ගත නොකරේ.